M 962

# පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ කාර්යසාඵල්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම් . ඒ. දීපානි

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි

ගුරු පුහුණු

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (සම්මාන සාමර්ථ)

අධ්‍යාපනපති උපාධි

UCLIB
588928

කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතාපූරණය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණ නිබන්ධනයකි. - 2016

සංක්ෂිප්තය...

ජාතියක අනාගතය රඳා පවත්නේ හුදෙක් පාසලත් එහි ගුරු මණ්ඩලයේ කාර්යභාරයත් මත ය. පාසල තුළ අනාගතයට ඇවැසි පුද්ගලයන් තැනීමේ වගකීම භාරව ඇත්තේ ගුරුවරයාට යි. එබැවින් අනාගතයට සාර්ථක පුරවැසියන් බිහි වන්නට නම් අද ගුරු කාර්යය මනාව නිරන්තර අධීක්ෂණයට, නිරීක්ෂණයට, විමර්ශනයට හා පර්යේෂණයට බඳුන් විය යුතු ය. එබැවින් ගුරු අධ්‍යාපනය හා ඔවුන්ගේ කාර්යසාඵල්‍යතාව විමසා බැලීම පිණිස මෙම පර්යේෂණය දියත් කරන ලදි.

ඒ අනුව මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ ශාස්ත්‍රීය හා වෘත්තීය අධ්‍යාපනය යන දෙක ම ලබා ගත් පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ගේ කාර්යසාඵල්‍යතාව විමසා බැලීමයි. ගුරුවරුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හා කාර්යසාඵල්‍යතාව ගැන විවිධ අර්ථකථන දී ඇතත් මෙමගින් බලාපොරොත්තු වන්නේ ශාස්ත්‍රීය අධ්‍යාපනය උපරිම වශයෙන් ලබා ගත් උපාධිධාරී ගුරුවරු ඉගැන්වීමට අවශ්‍ය වෘත්තීය පුහුණුව වන පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව හදාරා නිම කිරීමෙන් පසු එලෙස ලබා ගත් පුහුණුවට අනුව ඉගැන්වීම් කටයුතුවල යෙදෙනවාදැයි සොයා බැලීමයි.

මෙම පර්යේෂණය ප්‍රධාන අරමුණු 4කින් සමන්විත වේ. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව තුළින් ගුරුවරුයෙකු ලබා ගත යුතු වෘත්තීය කුසලතා විමර්ශනය කිරීම, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව නිම කළ ගුරුවරු ලබා ගත් පුහුණුවට අනුව ඉගැන්වීම සිදු කරන්නේදැයි සොයා බැලීම, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරී ගුරුවරුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ පවතින ගැටලු හඳුනා ගැනීම හා පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරීන් පිළිබඳ පාසල් පරිපාලකයින්ගේ අදහස් විමසා බැලීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා විස්තරාත්මක පර්යේෂණ ප්‍රවේශය ඔස්සේ අර්ධ සම්මිශ්‍රිත ගුණාත්මක ප්‍රමුඛ සහගාමී (Partially Mixed Qualitative dominant concurrent status design) පර්යේෂණ ක්‍රමය භාවිත කරන ලදි. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ උපකරණ ලෙස නිරීක්ෂණ, ප්‍රශ්නාවලී, සම්මුඛ සාකච්ඡා, මූලාශ්‍ර භාවිතය, සිසු අදහස් පත්‍රිකා මෙන් ම නාභිගත කණ්ඩායම් සම්මුඛ සාකච්ඡා ද භාවිත කරන ලදි. මෙහි නියදිය වන්නේ 2005 - 2012 කාලය තුළ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව නිමකළ ගුරුවරු 50ක්, සිසුන් 100ක්, රජයේ පාසල් 18ක විදුහල්පතිවරු 18ක් කථිකාචාර්යවරු 8ක් හා පශ්චාත් අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලා සමායෝජකවරු 4ක් අතුළත් වන 180 දෙනෙකි.

මේ අනුව පර්යේෂණයේ පළමු පරිච්ඡේදයෙන් අධ්‍යයන ගැටලුව හඳුන්වා දීම, අධ්‍යනයේ අවශ්‍යතාව පෙන්වා දීම, සංකල්ප නිර්වචනය කිරීම ආදිය සිදු කළ අතර දෙවන පරිච්ඡේදයෙන් සාහිත්‍ය විමර්ශනය තුළ ගැටලුවට අදාළ න්‍යාය හා මෙම පර්යේෂණයට අදාළ ආනුභවික පර්යේෂණ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදි. පර්යේෂණයේ තෙවන පරිච්ඡේදය මගින්

පර්යේෂණ ක්‍රමවේදය සැකෙවින් විස්තර කරන ලදි. පර්යේෂණයේ සිව්වන පරිච්ඡේදය යටතේ විවිධ දත්ත රැස් කිරීමේ උපකරණ ඔස්සේ ලබා ගත් දත්ත එක් එක් අරමුණට අදාළ වන ආකාරයට දත්ත ඉදිරිපත් කිරීම, විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම සිදු කරන ලදි. එලෙස ලබා ගත් දත්ත විශ්ලේෂණයට අනුව පස්වන පරිච්ඡේදයේ දී නිගමන හා යෝජනා ඉදිරිපත් කරන ලදි. මෙහි දී නිගමන යටතේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාධාරීන්ගේ කාර්යසාඵල්‍යතාව පුහුණුවෙන් පසු ක්‍රමික ව අඩු වෙමින් යන බවත් එයට බලපාන හේතු සාධක රාශියත් ඇති බවත් හඳුනා ගන්නා ලදි. මේවා අතර ගුරුවරුන්ගේ අඩුපාඩු, පාසල්වල ගැටලු, විදුහල්පතිවරුන්ගේ කළමනාකරණ ගැටලු මෙන් ම පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ අඩුපාඩු හා පාඨමාලා පිළිබඳ විධිමත් පසු විපරමක් නො මැතිවීම ද අනාවරණය කරගන්නා ලද අතර ගුරු ආකල්ප සංවර්ධනය, පාඨමාලා නවීකරණය හා යාවත්කාලීන කිරීම ආදිය වැදගත් බව හඳුනා ගන්නා ලදි.

Abstract

Future of a nation entirely depends on the school and role of the teaching staff. Thus responsibility of creating a useful citizen to the country within the school is entrusted to the teacher. Therefore, if successful citizens are to be raised for the future, the teacher's role should be subjected to continuous supervision, observation, investigation and experiments. Hence, this research is prepared to review about teacher education and efficiency of the teacher's role.

According to the said situation, the main concern of this research is to measure the efficiency of the role of teachers' who have obtained Post Graduate Diploma in Education and academic qualifications which required for the teaching profession. Even though, it has been given many definitions about the efficiency of role of teachers' and the teaching learning process, from this research I expect to inspect about the graduate teachers who obtained educational qualifications to the greatest level are acting according to the practice taken after completion of Post Graduate Diploma in Education programme.

This research consists of four main objectives. To fulfill the above objectives, I operated Partially Mixed Qïlitative domininunt Concurrent Status Design under descriptive research approach to investigate about the skills that the teachers have acquired through the Post Graduate Diploma in Education programme, to investigate whether teachers are involving in the teaching learning process according to the practice taken from Post Graduate Diploma in Education programme, to identify issues faced by the teacher in the teaching learning process, to inquire about the Post Graduate Diploma in Education holders from the school administration. Observations, questionnaires, interviews, source references, written accounts of students' ideas, interviews with centralized teams are operated as data collecting techniques for the sample of this research. The sample of the research consists with 180 individuals; 50 teachers who had completed Post Graduate Diploma in Education from 2005 to 2012, 100 students, principals from 18 schools, 18 lecturers, 4 coordinators of Post Graduate Diploma in Education Programme.

Accordingly, the first paragraph is on introduction of the academic issues, the necessity of studying about them, defining concepts and the second paragraph relates the

particulars of experiential research relevant to this research and relevant theory related to the issues in the literature review.
Research methodology is included in brief in the third chapter. Presenting data which has collected through different data collecting tools according to each and every objective, analysis and definitions are included forth chapter.

In the fifth chapter conclusion and suggestions presented according to the data analysis. Decline in the efficiency of the teachers' role of Post Graduate Diploma in Education Holders after training and reasons affected to that are identified in the conclusion. Among them shortcomings of the teachers, complicated situations in schools, management issues of the principals' as well as shortcomings of Post Graduate Diploma course and absence of methodical post inquiry after graduation are identified in the conclusion. As well as modification of this course and development of teacher's attitiudes too belongthis conclusion.